www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපති දෙමල ප්‍රභූව සමග “දේශපාලන විසඳුම” කල් දමයි.

## Sri Lankan president postpones "political solution" with Tamil elite

**විජේ ඩයස් විසිනි**

**2009 ජූලි 18**

සමස්ත ඉන්දීය හින්දු ඉංග්‍රීසි පුවත්පත සමග පැවති දිගු සම්මුඛ සාකච්ඡාවක දී ජනාධිපති මහින්ද රාජපක්ෂ, එල්ටීටීඊයට එරෙහිව ඔහුගේ ආන්ඩුව ගෙන ගිය යුද්ධයෙන් පසුව දෙමල ප්‍රභූ කොටස් වලට, එකඟතාවයක් පිලිබඳව ඔහු දුන් පොරොන්දුව, එනම් ඊනියා දේශපාලන විසඳුම, ඔහු දෙවන වතාවට ජනාධිපති තනතුරට පත්වීමට පෙරාතුව, ක්‍රියාවට නැගීම කෙසේ වෙතත් නිවේදනය කරන්නේ වත් නැති බව ප්‍රකාශ කලේ ය.

ජූලි 9 වන දිනෙන් නිමාවට පත්. කොටස් තුනකින් ප්‍රකාශයට පත් කල රාජපක්ෂගේ සම්මුඛ සාකච්ඡාව, දකුනු ඉන්දියාවේ තමිල්නාඩුවෙහි 8 කෝටියක් දෙමල ජනතාව සන්සුන් කිරීමේ ද, ඉන්දීය ධනේශ්වරයේ කලාපීය ආසක්තයන් සවිමත් කර ගැනීමේ ද අරමුනෙන් නැවත නැවතත් ‘‘දේශපාලන විසඳුමක්’’ සඳහා බලපෑම් කල ඉන්දීය දේශපාලන සංස්ථාපිතය සමග කරේ අත දමා ගැනීම සඳහා දරන ලද උත්සාහයකි.

කෙසේ වුව ද එල්ටීටීඊ යට එරෙහිව ඔහු ලත් මිලිටරි ජයග්‍රහන මධ්‍යයේ රාජපක්ෂ, පලමුව තමන් වරමක් ලබාගත යුතු බව ප්‍රකාශ කරමින් දේශපාලන විසඳුමක් පිලිබඳ මොනම වැඩ පිලිවෙලක් හෝ පසු පසට දමා තිබේ. ඔහුගේ පලමු ජනාධිපති නිල කාල සීමාව 2011 නොවැම්බරයට පෙර අවසන් නොවන නමුදු මැයි මැසයේ එල්ටීටීඊ පරාජය කල තැන් පටන් ඔහුගේ තන්ත්‍රය විසින් උසිගන්වනු ලැබූ ස්වෝත්තමවාදී වටපිටාව ගසාකෑමේ බලාපොරොත්තුව මත, ලබන වසරේ මුල මැතිවරනයක් ප්‍රකාශකල හැකි බවට ද සමපේක්ෂනය කෙරේ.

දේශපාලන විසඳුමක් පිලිබඳව කෙරෙන කථා සාමාන්‍ය දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ගැන කිසියම් ම හෝ උනන්දුවක් නිසා නොව සිදුවන්නේ, විදේශ ආයෝජකයන්ට දිවයින ආකර්ශනීය මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීමේ අරමුනෙන් කොලඹ ආන්ඩුව හා දෙමල ප්‍රභූ පැලැන්තිය අතර එකඟත්වයක් පතා ගෙනය. දෙමල වැසියන් දස දහස් ගනනක් මරනයට හා අංග විකලත්වයට පත්කල එල්ටීටීඊ යට එරෙහි රුදුරු මිලිටරි ආක්‍රමනයට තම පිටුබලය ලබාදුන් අතරවාරයේම ඉන්දියාව හා ප්‍රමුඛ බටහිර බලවතුන්, රාජපක්ෂට කියා සිටින්නේ එවන් ‘‘විසඳුමකට’’ එලඹෙන ලෙසයි. මෙම බලපෑම් කෙරෙහි අවනතභාවයක් පෙන්වමින් රාජපක්ෂ ‘‘දෙමල කථාකරන ජනතාවගේ, විශේෂයෙන්ම උතුරේ හා නැගෙනහිර, අපේක්ෂාවන් මුදුන් පමුනුවා ලීමේ’’යෝජනාවලියක් ගෙන ඒම සඳහා 2006 ජූනි මාසයේදී සර්ව පාක්ෂික නියෝජිත කමිටුවක් (ඒපීආර්සී) පිහිටුවන ලදී. ඒ සමග ම රාජපක්ෂ, 2002 සටන් විරාමය උල්ලංඝනය කරමින් 25 වසරක සිවිල් යුද්ධය යලි ආරම්භ කිරීමට යුහුසුලුව සූදානම් විය.

ඒපීආර්සී තරයේම ප්‍රෝඩාකාරී ව්‍යායාමයක් විය. එය අවසන් වාර්තාවක් ඉදිරිපත් කර නැතත්, මිලිටරි ආක්‍රමනය සිදු වෙද්දී පවා රැස්වූ අතර දැනට 46 වතාවක් මුනගැසී සාකච්ඡා කර ඇත. එහි අරමුන වූයේ, යුද්ධය හා එහි ආර්ථික බලපෑම පිලිබඳ ජනතා විරෝධය මොට කිරීමත්, ඉන්දියාව හා මහා බලවතුන් පිනවීමත්, වලිග කොටයක් බවට පත්ව ඇති දෙමල එක්සත් විමුක්ති පෙරමුන (ටියූඑල්එෆ්), සභාගයේ පාර්ශව කරුවෙකු වන ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) ඇතුලු එල්ටීටීඊ විරෝධී දෙමල පක්ෂ මුක්කු ගසා නැගිටුවීමත් ය.

සිය සම්මුඛ සාකච්ඡාවේ දී රාජපක්ෂ නරුම ආකාරයෙන් ප්‍රමාදයේ වරද, ඔහුගේ සිංහල ස්වෝත්තමවාදී කසකාරයන් සතුටුකිරීම සඳහා සර්ව පාක්ෂික නියෝජිත සමුලුවෙන් ඉවත්කර තැබූ, මුලින් එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) මත පැටවීය. ‘‘ටීඑන්ඒ නියෝජිතයන් පැමින සාකච්ඡාවලට සහභාගී විය යුතුය (දේශපාලන විසඳුම පිලිබඳ)’’යි ඔහු පැවසීය.

රාජපක්ෂ, පලමුවෙන් මැයි 19 දින පාර්ලිමේන්තුවේදී පැවැත්වූ ජයග්‍රාහී කථාව තුල

ප්‍රකාශයට පත් කල තම ආස්ථානය ද යලි ගෙනහැර දැක්වීය. එනම් ''ශ්‍රී ලංකාවේ සුලු ජාතීන් ඇත්තේ නැත. ඇත්තේ රටට ආදරය කරන්නවුන් හා එසේ නොකරන්නවුන් පමනි.'' මෙම ආස්ථානය, 1948 පටන් එක දිගට ඇදී ගිය දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හෙලාදැක ප්‍රතික්ෂේප කිරීමේ කොලඹ ආන්ඩුවල ප්‍රතිපත්තිය, අලුත් ඉහලකට ඔසවා තබයි. මෙම දෘෂ්ටියට අනුව, සුලු ජාතික දුක්පීඩා ගැන හෝ ඒ අර්ථයෙන් ජනගහනයේ කුමන කොටසකගේ හෝ මූලික අයිතීන් ගැන කරන කුමන සඳහනක් හෝ රාජද්‍රෝහී හා දේශද්‍රෝහී වෙයි.

නිදහසෙන් පසු සිංහල ප්‍රභූව, ස්වෝත්තමවාදය ඇවිස්සීමේත්, වාර්ගික රේඛා ඔස්සේ කම්කරු පන්තිය බෙදීමේත් අටියෙන් දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහරගැසීම වහාම ආරම්භ කලහ. ඔවුන්ගේ ඉන්දීය සම්භවය හේතුකොට ගෙන නොරටුන් ලෙස වර්ග කරමින්, 1948 පුරවැසි පනත මඟින් දෙමල කථාකරන වතු කම්කරුවන් දශ ලක්ෂයකට වැඩි සංඛ්‍යාවකගේ සිවිල් හා ඡන්ද අයිතිය අහෝසිකර දැමිනි. සිංහල එකම නිල භාෂාව බවට පත්කල 1956 භාෂා පනත මඟින් දෙමල ජනතාවට තවදුරටත් රජයේ රැකියාවල රැඳී සිටීමටත් උසස් අධ්‍යාපනය ලැබීමටත් අවශ්‍ය නම් සිංහල ඉගෙන ගැනීමට බල කිරීමෙන්, මෙම වෙනස්කම් කිරීම සමස්ත දෙමල ප්‍රජාව ම ආවරනය වන පරිදි පුලුල් කරනු ලැබුනි.

කම්කරු පන්තික අරගල හා ගම්බද පෙරලිකාරීත්වය හමුවේ බියට පත් ආන්ඩුව 1972 දී නව ව්‍යවස්ථාවක් ස්ථාපිත කරනු ලැබුවේ බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත්කරමින් දෙමල විරෝධී හා හින්දු විරෝධී පිලිවෙත එහි උච්ඡස්ථානයට ගෙන ආවේය. පැරනි ට්‍රොට්ස්කිවාදී ලංකා සමසමාජ පක්ෂය (ලසසප) හා ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමඟ හවුල් වූ දෙවන සභාග ආන්ඩුව විසින් ගෙන ආ මෙම පනත, දෙමල බෙදුම්වාදී ව්‍යාපාර එලි දැක්වීමට හේතු කාරක වෙමින් වාර්ගික සම්බන්ධතාවයේ සන්ධිස්ථානයක් සලකුනු කලේය.

සිය මිලිටරි ජයග්‍රහනය තුලු මරමින් රාජපක්ෂ දැන් සුලු ජාතීන්ගේ පැවැත්ම ම පිලිකෙව් කරන අතර තමන්ගේ ''විසඳුම'' පිලිගත යුතු යයි නියම කරයි. ප්‍රජාතන්ත්‍රවාදයේ සියලු සලුපිලි උනා දමා ඔහු අවධාරනය කලේ ''දිය යුත්තේ කුමක් ද නොදිය යුත්තේ කුමක් ද යන්න මම දනිමි. ජනතාව මට වරමක් දී ඇත. මම එය පාවිච්චි කරන්නට යන්නෙමි. එහෙත් මම මේ මිනිසුන් (ටීඑන්ඒ නියෝජිතයන්) මෙයට නම්මා ගත යුතුය. එසේම ඔවුන් තමන්ට අවශ්‍යදේ ලබාගත නොහැකි බව ද දැනගත යුතුය.''

රාජපක්ෂ තමන්ගේ ම පක්ෂයේ මෙන්ම සභාගයේ හවුල්කාර ජාතික හෙල උරුමයේ ද දැනට ආන්ඩුවෙන් පිටත සිට සිංහල අධිපතිවාදය වෙනුවෙන් උද්ඝෝෂනයේ යෙදී සිටින ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ද සිංහල ස්වෝත්තමවාදීන්ගේ සහයෝගය මත බෙහෙවින් රැඳී සිටියි. ඔහුගේ ප්‍රකාශ සැලසුම්කර ඇත්තේ මෙම ප්‍රතිගාමී කොටස් සතුටු කරන අතර වාරයේ සමාජ නොසංසුන්තාවය සමඟ ගනුදෙනු බේරාගැනීමට සිය බලය පුම්බාගැනීම සඳහා ය. ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි ජනාධිපතිගේ සතුරුකම රඳවාගෙන සිටින 300,000 ක් පමනවූ දෙමල යුද අනාථයන් ගැන ඔහු කල ප්‍රකාශයන්ගෙන් මනාව පැහැදිලි කෙරෙයි. අනාථ කඳවුරු තුල තත්ත්වය පිලිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානවල, රතු කුරුසයේ, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ හා අනෙකුත් ජාත්‍යන්තර කන්ඩායම් වල වාර්තා පසෙක ලමින් රාජපක්ෂ මෙසේ පැවසීය. ''අපගේ කඳවුරු වෙනත් ඕනෑම රටක ඇති කඳවුරු වල තත්වයට වඩා අනර්ග බව මා පැවසිය යුතුය.''

රාජපක්ෂ එසේ පැවසූයේ, බෝවෙන රෝග පැතිරී යාම නිසා සෑම සතියක ම මිනිසුන් 1,400 ක් මිය යන බව සහන අයතන ජාත්‍යන්තර මාධ්‍ය තුලින් වාර්තා කල අතර වාරයේය. කඳවුරු තුල අවශ්‍ය සනීපාරක්ෂක පසුකම් නොමැතිකම ගැන සඳහන් කරමින් ඔහු, යුරෝපීය සංගමය විසින් සපයා ඇති අරමුදල් මුදාහැරීම ''අතිශයින්ම මන්දගාමී'' යයි එක්සත් ජාතීන්ගේ ආධාර ආයතනවලට චෝදනා නැගූ අතර සිය වගකීමෙන් අත සෝදා ගත්තේය.

අනාථයන් ආරක්ෂිත ස්ථාන කරා යැවිය නොහැක්කේ මන්දැයි ඇසූ ප්‍රශ්නයකට පිලිතුරු වශයෙන් රාජපක්ෂ කියා සිටියේ, එක්සත් ජාතීන් එම ප්‍රදේශ බිම් බෝම්බ වලින් තොර බව සහතික කරන තෙක් යලි පදිංචි කිරීම් සිදු නොවන බවයි. අනාථයින් දින 180 ක් තුල යලි පදිංචි කිරීමේ ඔහුගේ ප්‍රකාශිත ''ඉලක්කය'' ගැන ඔහු සඳහන් කලේ හෝ ඔහුගෙන් විමසුවේ හෝ නැත.

සම්මුඛ සාකච්ඡාවේ අවසන් භාගය තුල රාජපක්ෂ නොදැනුවත්ව ම වාගේ යුද්ධය යලි දියත් කිරීමේදී ඔහු ඇද බෑ මුසාවාද හෙලිදරව් කලේය. සටන් විරාමය යටතේ සිදුවන ඇතැයි අපේක්ෂා කල සාකච්ඡා ඔහු බැහැර කලේය. ''ආරම්භයේ පටන් ම මම ඒ සඳහා (මිලිටරි ක්‍රියාන්විතයන්) ලක ලෑස්ති වෙමින් සිටියෙමි. මට අත්දැකීම් තිබුන නිසා මම දැන සිටියෙමි. ඔවුන් (එල්ටීටීඊ) කිසි විටෙකත් අවි බිම තබා සාකච්ඡා ආරම්භ නොකරන බව අපි දැන සිටියෙමු.''

පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා බලකිරීමේ අටියෙන් එල්ටීටීඊ විසින් වාරිමාර්ග සොරොව් කට අවහිර කිරීමේ 2006 ජූලි මාසයේ මාවිල්ආරු සිද්ධිය ගැන රාජපක්ෂගෙන් විමසන ලදී. ජනාධිපති මෙසේ කීවේය. ''ඔවුන් (එල්ටීටීඊ) මා වෙත කොල එලිය දැල්වූ වේලාව එයයි.'' වෙනත් වචන වලින් කිව හොත් රාජපක්ෂ එල්ටීටීඊ යේ සුලු විරෝධතා

ක්‍රියාව ''ආරක්ෂක මෙහෙයුම්'' යන කඩතුරාව යටතේ පූර්න යුද්ධය සඳහා නිමිත්ත බවට පත්කර ගත්තේය.

සම්මුඛ සාකච්ඡාවේදී රාජපක්ෂ, 2002 සටන්විරාමය ඇතිකර ගැනීමට සහායදුන් නෝර්වීජියානු දේශපාලඥ එරික් සෝල්හයිම් හා රාජපක්ෂ අතර 2006 මාර්තු මාසයේදී ඇතිවූ හමුවක් ගැන කථාන්තරයක් මාට්ටු කර ගැනීමට හිමින් සීරුවේ මැදිහත් විය. ''තවත් නොයෙකුත් කථා අතර මැද සෝල්හයිම් මෙසේ පැවසුවා, ප්‍රභාකරන් (එල්ටීටීඊ නායක) මිලිටරිමය සුධීමතෙකි. ඔහු ක්‍රියාවේ යෙදී සිටිනු මම දැක ඇත්තෙමි. යනාදී වශයෙන්,'' ජනාධිපති මෙසේ පැවසීය. ''ඔහු උතුරු කැලයේ මිනිසෙකි. මම දකුනු කැලයේ මිනිසෙකි. අපි බලමු කවුද දිනන්නේ කියලා. එය හොඳ අනාවැකියක් විය''

2005 නොවැම්බර් මැතිවරනයෙන් පසුව සමාජවාදී සමානතා පක්ෂය, ඔහු යුද්ධයේ ජනාධිපතිවරයෙක් බවට කල අනතුරු ඇඟවීම මෙම ප්‍රකාශයන්ගෙන් සනාථ වෙයි. රාජපක්ෂ හා ඔහුගේ ශ්‍රීලනිපය ආන්තික වශයෙන්ම ප්‍රදර්ශනය කර ඇත්තේ, පෙර යටත් විජිතයන්හි ධනේශ්වර පන්ති, පීඩිත සුලුතරයන්ගේ අයිතීන් ද ඇතුලු ප්‍රජාතන්ත්‍රීය කර්තව්‍යයන් විසඳීමෙහිලා දක්වන ඓතිහාසික නොපොහොසත් කමයි.

ඉන්දියාවේ සම්ප්‍රධායික ප්‍රතිමල්ලවයා වන චීනය සමඟ රාජක්ෂ ගොඩනඟාගෙන ඇති සමීප සම්බන්ධකම් නිසා ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ දේශපාලන සංස්ථාපිතයන් අතර පලුදු වී ඇති බැඳීම්වලට පැලැස්තර ඇලවීමට සම්මුඛ සාකච්ඡාව උත්සාහයක් දරා ඇත. බීජිනය යුද්ධය ජයගැනීම සඳහා කෙලින්ම මිලිටරි ආධාර සැපයූ අතර ඉන්දියාව තමිල්නාඩුවේ නොසතුට නිසා යුද්ධයට කෙලින්ම ආධාර කිරීමෙන් වැලකී සිටියේය.

හින්දු පත්‍රයේ කර්තෘ එන් රාම් රාජපක්ෂ වෙත ප්‍රධාන ප්‍රශ්නයක් යොමු කලේය. ''මෑත වර්ධනයන් කෙරෙහි ඉන්දියාවේ ප්‍රතිචාරය පිලිබඳව සමස්තයක් ලෙස ගත් කල ඔබ සෑහීමකට පත්වන්නේ ද? රාජපක්ෂ මෙසේ පිලිතුරු දුන්නේය. ''ඔව් පලමුවෙන් ම සිදුවන්නේ කුමක් ද යන්න වටහාගැනීමෙන් ඉන්දියාව බෙහෙවින් උපකාරී විය. අපට අවශ්‍ය අවි ආයුධ අපි චීනයෙන් මිලට ගත්තෙමු. එය වානිජ්‍ය ගනු දෙනුවකි. චීනය අපට උදව් කලා, යමෙකු ඔබට උදව් කරන විට ඔබ එය අගය කරන්නෙහිය, එසේ නොවේ ද? එහෙත් අප ඔවුන්ට ගෙව්වේ ජාත්‍යන්තර මිල ගනන්ය. ඒ පිලිබඳව අප නිශ්චිතය.''

බලවතුන් දෙදෙනා අතර තුලනය වීමට උත්සාහ කරමින් රාජපක්ෂ, ඔහු ඉන්දියාවට උදව් කල අවස්ථාවක් සිහි ගැන්වීය. (බ්‍රිතාන්‍ය) පොදුරාජ්‍ය මන්ඩලයේ මහලේකම් තෝරාගැනීමේ ක්‍රියාවලියේ දී මම ඉන්දියාව වෙනුවෙන් ප්‍රචාරක කටයුතුවල යෙදුනෙමි. මම හිතන්නේ නෑ වෙනත් කිසිදු රටක නායකයෙකු එතරම් විවෘත ලෙස එසේ කරතියි කියා. එම තනතුර සඳහා උනන්දුවක් දැක්වූ අය ශ්‍රී ලංකාවේ ද සිටියා. එහෙත් මම කියා සිටියා මට ඉන්දීය අපේක්ෂකයෙකු අවශ්‍ය බව. නව දිල්ලියට සහතික වීම් වස් ඔහු මෙය ද ඊට එකතු කලේය. ''මෙම කලාපයේ දී අපට නායකයෙකු සිටිය යුතුය.''

රාජපක්ෂගේ අභිමතය කුමක් වුවත්, ඉන්දියාව හා චීනය අතරත් අනෙකුත් ලෝක බලවතුන් අතරත් ගැටුම් උග්‍රවන තත්ත්වය තුල, කොලඹ සංස්ථාපිතයට උපාමාරු දැමීමට ඇති හැකියාව එන්ට එන්ටම ගැටලු සහගත වී තිබේ.

රට තුල සමාජ හා පන්ති ආතතීන් පිලිබඳව ද එයම අදාල වේ. දෙමල ජනතාව පෑගීම හා ආර්ථික බර වැඩ කරන ජනතාව මත පැටවීමට දරන ආන්ඩුවේ උත්සාහය තුලින් එම ගැටලුව උග්‍ර අතට හරවා තිබේ.

© www.wsws.org